10 ශ්‍රේණිය

නිපුණතාව 2.0

## ස්වකීය පකරිල්පන මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

### 2.6 නාට්‍ය අවස්ථා නිර්මාණය කරයි.

මොකද බලන්නේ ස්ක්‍රීන් දාල ප්‍රොජෙක්ටර් හයි කරලතියෙන්නේ ඇයි කියලද? මම කියන්නම්. ඉක්මනට වාඩිවෙන්න. ඔයාලගේ ම කට්ටියක් කලින් පීරියඩ් එකේ ඇවිත් මේ වැඩේට උදව් කළා. දැන් බලන්න මේ අවස්ථාව. (හුණුවටයේ කතාවේ යුධ කෝලහාලය හා ගෲෂා දරුවා රැගෙන පැන යාම) මොකක්ද මේ නාට්‍යය.. ඔව් හුණුවයටයේ කතාව. කාගෙද මේ නාට්‍යය.? ඔව් ලංකාවේ නිෂ්පාදනය කලේ හෙන්රි ජයසේන මහත්තයා, පස්සෙ කාලෙක පරාක්‍රම නිරිඇල්ල මහත්තයා ජන කරලිය නිස්පාදනයක් විදියටත් කළා 2013 රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නිෂ්පාදනය විදියටත් සම්මාන ගත්තා. මේක පර්වර්ථන නාට්‍යයක් විදියට තමයි හඳුන්වන්නේ. බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ කොකේසියන් චෝර්ක් සර්කල් නාට්‍යය. හරි. මේකත් බලන්න. (කැලණි පාලමේ ආරම්භක දර්ශනය) මේ නාට්‍යය මොකක්ද? ඔව් ආර් ආර් සමරකෝන් මහත්තයගේ කැලණි පාලම නාට්‍යය.

දැන් ඔයාල දැකපු සිදුවීම් දෙක මම ආයෙමත් පෙන්නනවා. බලන්න. ඒ අවස්ථා ගැන අවධානයෙන් බලන්න.

ඕගොල්ලො දැකපු දේවල් කියන්න. ඒ දෙකේම යම් ගැටළුකාරී අවස්ථාවක් තිබුණද? හරි මොනාද? ඔව් අම්මා සහ පුතා අතර යම් අර්බුදයක් කැලණි පාලමේදි පෙණුනා. හුනුවටයේ කතාවේ.? ඔව් මයිකල් කුමාරයව අරගෙන යන ගෲෂාට ඊළඟට මොනවා වෙයිද කියන ප්‍රශ්නය ආවා. එම සිදුවීම් ඇතුළෙම ඒ ඒ චරිතවල යම් යම් ස්වභාවයන් අපට පෙනුණා. ගැටුම්කාරී අවස්ථාවක්, චරිත ප්‍රශ්නයක මුහුණ දී තිබෙනවා. ඒ තුළ කුතුහළයක් තියෙනවා. හරි.

දැන් මම කණ්ඩායම් කීපයක් හදනවා. ඔව් ඊයෙ කණ්ඩායම් ම දාමු. නැත්නම් ඒකටත් වෙලාව යනවනේ. හරි ඒ නැති අයට අද ආව අය ගන්න. නෑ නෑ චනුද මේකලාලගේ එකට යන්න. මම උදව් කරන්නේ නෑ. විනාඩි පහළවක් දෙනවා. ඕගොල්ලො අහල තියෙන කතාවක්, ජන කතා, ප්‍රබන්ධ කතා ඒ කිව්වේ, නවකතා, කෙටිකතා වගේ ඒ ඕනම එකක කතාවක් ඔයාල බලපු නාට්‍යවල තිබ්බ ඒ ලක්‍ෂණ මතු වෙන විදියට හදාගන්න. ක්‍ෂණික නිරූපණවල දි වගේ නෙවෙයි, රිහසල් කරගන්නත් පුළුවන්.

හරි දැන් පටංගන්න. (සිසුන් සූදානම් වේ)

දැන් ඉදිරිපත් කිරීම් කරන්න ඕනේ. එක කණ්ඩායමක් කරද්දි අනිත් අයට ලැස්තිවෙන්න බෑ. හැමෝම අනිත් අයගේ නිර්මාණය බලන්න ඕනේ, එකක් කරල ඒ අයගේ අඩුපාඩු හොඳ ඔයාල ම කියන්න. මම කියන්නෙ නෑ. (එකිනෙක නිර්මාණ ඉදිරිපත් කිරීම හා සිසුන් ඒ ගැන අදහස් දැක්වීම)

හොඳයි, ඔයාල කියපු දේවල් මම අහගෙන හිටියේ, ඉදිරිපත් කිරීමුත් බැලුවා. දැන් තේරුණා ද කරද්දි අමතක වුණු කාරණා අනිත් අයගේ නිර්මාණ බලද්දි තමන්ටත් දැණුනා කියලා. ඔක මංම කිව්ව නම් ඔයාලට එහෙම දැනෙන්නෙ නෑ. මම දැක්ක අනිත් අයගෙ අඩුපාඩු කියල ඔයාලත් කණ්ඩායමේ අනිත් අයත් එක්ක කුටු කුටු ගානවා. ඒ කියන්නෙ ඔයාලත් කළේ ඒකමයි. ඒ කියන්නේ අපි හැමෝම පොදු අඩුපාඩු කීපයක් කරලා තියෙනවා. හරි දැන් වෙලාව ඉවර වීගෙන යනවා.

ගෙදරදී මේ වැඩේ කරන්න. පොතේ ලියාගන්න.

ඔබ කියවා ඇති කෙටි කතා, නව කතා හෝ වෙනත් සාහිත්‍ය නිර්මාණ කෘතියක් පදනම් කොටගෙන නාට්‍යොචිත අවස්ථාවක් සහිත නාට්‍ය පෙළක් රචනා කරන්න.